# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2155/34 - 2019 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2019.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක 57

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20 (5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයෙකු, ආනයනකරුවකු, අසුරන්නකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින්, පහත දක්වා ඇති ඇසුරුම්ගත සිමෙන්ති වර්ග එහි සඳහන් කර ඇති උපරිම සිල්ලර මිලට වඩා වැඩියෙන් වෙළෙඳාම් කිරීම, වෙළෙඳාම කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| *වර්ගය* | *උපරිම සිල්ලර මිල (කි. ග්‍රෑ. 50 ඇසුරුමක් සඳහා) රු. ශත* |
|---|---|
| ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සිමෙන්ති (Cement manufactured in Sri Lanka) | 1,005.00 |
| සිමෙන්ති කුඩු ලෙස ආනයනය කොට ශ්‍රී ලංකාවේ ඇසුරුම්ගත කළ සිමෙන්ති (Cement imported in bulk form & packetted in Sri Lanka) | 950.00 |
| ඇසුරුම්ගතව ආනයනය කරන සිමෙන්ති (Cement imported in packetted form) | 930.00 |

මෙම නියෝගය 2019 දෙසැම්බර් මස 27 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

මේජර් ජනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික),
සභාපති.

2019 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.


1A - PG 4693 — 217 (2019/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*